## වනජීවී සංරක්ෂණ අරමුදල - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට වනජීවී සංරක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 1.2.1 ගණම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගොඩනැගිලි සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ අයිතම 17 කට අදාල එකතුව රු.55,895,662 ක් වූ වියදම, මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ලෙස නොදක්වා ස්ථාවර වත්කම් ලෙස පෙන්නුම් කර තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී රු.43,526,689 ක් වටිනා අලි වෙඩි මිලදීගෙන තිබූ අතර ප්‍රධාන කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය ඒකක 31250 ක් විය. එම තොගය භෞතිකව ගණනය කොට එහි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) භෞතික තොග ගණනයක් සිදුකර නොතිබුණු අතර කිරිපිටි තොගය සහ ඖෂධ තොගය පිළිවෙලින් රු.1,490,411 ක් හා රු.11,218,465 ක් වූ පොත් අගය මත ගිණුම් ප්‍රකාශයන් වල ඇතුළත් කර තිබුණි.

(ඈ) රු.1,385,646 ක් වූ ලැබී තිබූ ආදායම් ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම, එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඉ) වර්ෂයට අදාල සත්‍ය ප්‍රසාද දීමනා මුදල එනම් ගෙවිය යුතු නිලධාරීන් ගණන හා එක් එක් නිලධාරියාට ගෙවිය යුතු පමාණය නිශ්චිතව හඳුනාගෙන ගිණුම් ගත කරනු වෙනුවට රු. 24,090,000 ක් වූ වර්ෂයේ දළ මුදල් ආදායමින් සියයට 60 ක්, එනම් රු. 14,454,000 ක් ප්‍රසාද දීමනා ලෙස ගිණුම් ගත කොට තිබුණ.

### 1.2.2 නොසැසඳු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ලැබීම් ගෙවීම් ගිණුමේ ශේෂය රු.1,115,525,248 ක් වූ අතර භාණ්ඩාගාර ගිණුම් සාරාංශය අනුව ශේෂය රු.1,113,817,176 ක් විය. රු.1,708,072 ක් වූ වෙනසට හේතුව හඳුනාගැනීමකින් හා නිසි අනුමැතියකින් තොරව ගැලපුම් ගිණුමක් මගින් සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වර්ෂයකට වඩා පැරණි එකතුව රු.16,045,658 ක් වූ ලැබිය යුතු ශේෂ 09 ක් සහ රු.25,900,809 ක් වූ ගෙවිය යුතු ප්‍රසාද දීමනා ශේෂයක් පැවති අතර, වර්ෂ 03 කට වඩා පැරණි ගෙවිය යුතු සේවා ගාස්තු ශේෂය රු.3,255,318 ක් විය.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| අරමුදල මගින් 2012 වර්ෂයේද වාහන 10 ක් මිලදී ගැනීම. | 27,479,592 | රක්ෂණාවරණ සහතික. |
| උසාවි දඩ මුදල් | 2,784,517 | විස්තරාත්මක උපලේඛන |
| උපචිත වියදම් | 15,745,392 | විස්තරාත්මක උපලේඛන |
| ප්‍රසාද දීමනා | 25,900,392 | විස්තරාත්මක උපලේඛන |

(ආ) 2008 වර්ෂයේ සිට ගිනි අවි, පතොරම් හා අලි වෙඩි පළිබඳව ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. එසේම යථෝක්ත වත්කම් පිළිබඳ ඉන්වෙනට්‍රි ලේඛනයක් ප්‍රාදේශීය කාර්යාල වල නඩත්තු කර නොතිබුණ අතර පැවතිය යුතු තුවක්කු ප්‍රමාණය කොපමණද යන්න පිළිබඳ විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය . තවද මෙයට පෙර සිටි නිලධාරීන්ද තමා භාරයේ පවතින වත්කම් ලිඛිතව භාර දීමක් ද සිදුකර නොතිබුණි.

## 1.2.5 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2009 අංක 22 දරන පනතින් සංශෝධිත1937 අංක 02 දරන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 06 (1) (ඒ) වගන්තිය | යම් පාරක් තැනීම තහනම් ක්‍රියා ලෙස දක්වා තිබියදී විල්පත්තු ජාතක උද්‍යානය තුළ නීති විරෝධී ලෙස එලුවන්කුලම කලාඔයේ සිට කොන්ඩච්චිකුඩා දක්වා කි.මීටර් 55 ක් පමණ දිගෙන් යුක්ත නව මාර්ගයක් සකස් කර තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි | |
| i. මු.රෙ 104 | සමාලෝචිත වර්ෂයේ මිලදීගත් ඩබල් කැබ් රථයක් අනතුරට ලක්වී තිබු අතර අළුත්වැඩියාව සඳහා රු.102,600 ක් වැයකර තිබු අතර රක්ෂණාවරණයක් නොමැති වීම හේතුවෙන් වියදම ප්‍රතිපූර්ණය කරගැනීමට නොහැකි වී තිබු අතර අලාභයට වගකිවයුතු අයගෙන් එය අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. |
| ii. මු.රෙ 177 | ලද මුදල් එදිනම හෝ පසු දින බැංකු ගත කළ යුතු වුවත් දින 02 සට දින 11 දක්වා කාලයක ප්‍රමාදයක් පැවතුණි. |
| iii. මු.රෙ 755 | නිලධාරීන් ස්ථාන මාරුවී යාමේදී සංචාරක බංගලා 05 ක භාණ්ඩ භාරදීම හා භාරගැනීම සිදුකර නොතිබු අතර, භාණ්ඩ ඌනතාවයට වගකිවයුතු නිලධාරීන්ගෙන් එම වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

iv. මු.රෙ 756 හා 757 — මනම්පිටිය බිට්ටු කාර්යාලය හා නව බූතව සංචාරක නිවාසයට ඇති වත්කම් හා තොග භෞතිකව සමීක්ෂණයට ලක් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.442,202,868 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු.509,253,575 ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.67,050,707 ක පිරිහීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී උද්‍යාන පිවිසුම් ගාස්තු ආදායම රු.මිලියන 62.46 ක් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

අරමුදලේ 2011 වර්ෂයේ ආදායම රු.මිලියන 724.8 ක් වූ අතර එය 2012 වර්ෂයේදී රු.මිලියන 733.4 ක් දක්වා රු. මිලියන 8.6 කින් හෙවත් සියයට 1.19 කින් වැඩිවී තබුණි. 2011 වර්ෂයේ වියදම රු.මිලියන 215.58 ක් වූ අතර 2012 වර්ෂයේදී එය රු.මිලියන 291.17 ක් දක්වා රු.මිලියන 75.59 කින් හෙවත් සියයට 35 කින් වැඩි වී තිබුණි.

### 2.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

සමාලෝචිත වර්ෂය තුලදි බාහිර ආයතන සහ පුද්ගලයන් විසින් දෙපාර්තමේන්තුවට විරුද්ධව අධිකරණය තුළ නඩු 14 ක් පනවා තිබු අතර ප්‍රධාන කාර්යාලය හදිසි වැටලිම් ඒකකය විසින් 2012 ජනවාරි සිට අගෝස්තු 31 දක්වා බාහිර පාර්ශවයන් වෙත පවරන ලද නඩු සංඛාව 601 කි.

### 2.4 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම

සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 114.12 සිට රු. මිලියන 225.20 දක්වා වූ වියදම් අයිතම 08 ක සියයට 21 සිට සියයට 100 ක් දක්වා පරාසය වැඩිවී තිබුණි. ස්වෙච්ඡා මාර්ගෝපදේශ දීමනා රු. මිලියන 44.58 ක් ගෙවා තිබූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 41 කින් වැඩිවී තිබුණි. එසේ වුවද වර්ෂයට අදාල උද්‍යාන පිවිසුම් ගාස්තු අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) ප්‍රදේශයේ වනඋද්‍යාන 03 ක අඩවි කාර්යාල 11 ක් හා බීට්ටු කාර්යාල 12 ක් ස්ථාපිත කර තිබියදි, වනඋද්‍යාන තුළ බාහිර පාර්ශවයන් විසින් ගංජා වගා බිම් 56 ක් පවත්වාගෙන ගොස් තිබුණි.

(ආ) නැගෙනහිර කළාපයේ හෙනානිගල බීට්ටු කාර්යාලයෙ ස්ථාන භාර නිලධාරි සේවා ස්ථානයේ රැඳි නොසිටිම සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) සංචාරකයන් උද්‍යාන තුළට ඇතුලු කිරීමේදී හා පිටවීමේදී විදේශිය සංචාරකයින් හා දේශිය සංචාරකයින් ගණන කොපමණද යන්න හා නිකුත් කර ඇති ප්‍රවේශ පත්‍ර අංකයන් කවරේද යන්න සටහන නොවීමත් එම ප්‍රවේශපත්‍ර අවලංගු කිරීමක් සිදු නොකරන බැවින්ද ප්‍රවේශපත්‍ර ආදේශ කිරීමට හෝ අයථා පරිහරණයට ඉඩකඩ පවති.

(ආ) පරිගණක දෝෂ නිවැරදි නොකිරීම හේතුවෙන් පෙර නිකුත් කරන ලද අවසර පත් අංක හා මුදල් වටිනාකම් නැවත මුද්‍රණය වීම සිදුවී තිබුණි. මේ අනුව පරිගණක මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කළද ඒ පිළිබඳ අභ්‍යන්තර පාලනය දුර්වල තත්ත්වයක පවති.

(ඇ) උඩවලව ජාතික වනෝද්‍යානය වෙත පැමිණෙන සංචාරකයින් සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලට සපයනු ලබන ආදායම් වාර්තා වල දෛනක ආදායම් වාර්තා නිවැරදි නොවීම හා දෛනික ආදායම් වාර්තා මගින් දක්වා ඇති සංචාරකයින් පැමිණි සංඛ්‍යාවන් නිවැරදිව නොතිබීම සම්බන්ධයෙන් පරීක්ෂාකර බලා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) උඩවලව ජාතික වනෝද්‍යානයේ ස්වේච්ඡා සේවකයන් 35 දෙනෙකු සෙවයෙ යොදවා තිබු නමුත් චෙක්රෝල් නඩත්තුකර නොතිබුණි. දෛනික වැඩ පැවරීමේ ලේඛනයක් ද පවත්වා නොතිබුණි. මේ අනුව එම සේවකයන් රාජකාර්යට වාර්තාකර වැඩබිම් වල සේවයේ යෙදුනෙහිද යන්න තහවුරු කරගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඉ) උඩවලව ඇත් අතුරු සෙවණේ රු.58,000 ක් වටිනා පොත් 16 ක් අස්ථාන ගත වීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ගෙන් අලාභය අයකර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) උඩවලව ජාතික උද්‍යානය වෙත 2011 ජුලි 13 දින භාරදී තිබූ පොදු 172 උප පත්‍රිකා පොත් 10 ක් හා 2012 මාර්තු 01 දින භාරදී තිබූ උප පත්‍රිකා පොත් 03 ක් අස්ථානගත වී තිබුණි. තවද 2011 පෙබරවාරි 13 දින ප්‍රධාන කාර්යාලයෙන් ලැබී තිබූ පාවිච්චි නොකළ උප පත්‍රිකා පොත් 12 ක් උද්‍යාන කාර්යාලයේ රඳවාගෙන තිබූ බව 2013 ජනවාරි 22 භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. උප පත්‍රිකා පොත් පිළිබඳ දුර්වල අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් කළමනාකරණය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) වනසත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැක්ම ලෙස "වර්තමාන සහ අනාගත පරම්පරාවන් සඳහා වනජීවී උරුමයන් සංරක්ෂණය කිරීම" දක්වා තිබුණද අලි මිනිස් ගැටුම් හේතුකොටගෙන අලි මරණ සංඛ්‍යාව 2007 වර්ෂයේ සිට 2012 දක්වා සීඝ ලෙස වැඩිවී තිබුණි. මෙම තත්ත්වය අවම කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. වනජීවී දෙපාර්තමේන්තුව ලබාදුන් සංඛ්‍යා අනුව ඒ ඒ වර්ෂවල අලි මරණ සංඛ්‍යාව පහත දැක්වේ.

| වර්ෂය | අලි මරණ සංඛ්‍යාව |
|---|---|
| 2007 | 189 |
| 2008 | 224 |
| 2009 | 228 |
| 2010 | 227 |
| 2011 | 255 |
| 2012 | 250 |

(ඌ) අලි සංරක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යයන් සහ වගකීම් 08 ක් දක්වා තිබුණද වන අලි මංපෙත් සහිතව සංරක්ෂණ ප්‍රදේශ ස්ථාපිත කිරීම, ජාතික අලි සංරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම වැනි ප්‍රධාන කාර්යයන් හා වගකීම් වෙනුවෙන් වියදම් දරා නොතිබුණු අතර, අලි සංරක්ෂණය කිරීමට නොව අලි පළවා හැරීමට, මර්දනය කරීමට, වනසතුන්ගෙන් වන හානි වෙනුවෙන් වන්දි ගෙවීමට, අලි වෙඩි මිලදී ගැනීමට, අලි මිනිස් ගැටුම් මැඩලීමට ගජමිතුරෝ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා විදුලි වැට ඉදිකිරීම ආදි වැඩ සටහන් වෙනුවෙන් පහත සඳහන් පරිදි වැය දරා තිබුණි.

| විස්තරය | වර්ෂය 2011 රු. මිලියන | වර්ෂය 2012 රු. මිලියන |
|---|---|---|
| අලි පළවා හැරීමේ වියදම | 0.36 | 5.95 |
| මහජනයාට සතුන්ගෙන් වන හානි වෙනුවෙන් වන්දි ගෙවීම | 25.18 (සිද්ධි 1348) | 15.90 (සිද්ධි 3183) |
| අලි පළවාහැරීමට අලි වෙඩි මිලදී ගැනීමේ වියදම් | 41.14 (මිලදීගත් වෙඩි සංඛ්‍යාව 514,000) | 43.52 (මිලදීගත් වෙඩි සංඛ්‍යාව 514,000) |
| ගජ මිතුරෝ වැඩසටහන ක්‍රියාත්මක කිරීම (වනඅලි මිනිස් ගැටුම් මැඩලීමට) | 300 | 802.62 |

ඉහත කරුණු අනුව අලි සංරක්ෂණය යන ප්‍රධාන කාර්යයන් ඉටුකිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

(ඕ) උද්‍යානය නැරඹීමට පැමිණෙන විදේශීය වැඩිහිටියන් සඳහා ඩොලර් 15 ක් ද විදේශීය ළමයින් සඳහා ඩොලර් 08 ක් ද දේශීය වැඩිහිටියන් සඳහා රු.60 ක් හා ළමයින් සඳහා රු.30 ක ලෙස පොදු 172 කුවිතාන්සිය භාවිතයෙන් අයකර තිබුණි. පොත් අංක Z/27 490,001 පොත පරීක්ෂාවේදී කුවිතාන්සි නිකුත් කළ සංචාරකයින් අතර සියයට 99 ක් ම දේශීය සංචාරකයින් විය. මේ අනුව පොදු 172 කුවිතාන්සි වල කාර්යාල පිටපතේ දේශීය සංචාරකයින්ගේ ගාස්තු අය කළ බවට වෙනස් කිරීම තුළින් වංචා සිදුකළ හැකි බව නිරීක්ෂණය විය. මෙම අහිතකර තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කළයුතු බවට විගණන කමිටු රැස්වීමේදී එකඟ වුවද එය නිවැරදි කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරන ලැබේ.

(අ) අංගම්මැඩිල්ල ජාතික උද්‍යානයේ අලි ගාල් ඉදිකිරීම හා අලි ගොඩ බැමේ වේදිකාව ඉදිකිරීම වෙනුවෙන් රු. 4,574,919 ක් වැය කර තිබුණද එම ගොඩනැගිලි නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) තිඹිරියමංකඩ සංචාරක නිවාසය අළුත්වැඩියා කිරීම සඳහා රු. 564,055 ක් වැයකර තිබුණද සංචාරක බංගලාවේ කොටසක් ජලයෙන් යටවී තිබීම හේතුකොටගෙන නවාතැන් පහසුකම් සඳහා නුසුදුසු තත්ත්වයක පැවතුණු අතර, වැය කරන ලද රු. 564,055 මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. එමෙන්ම මෙම සංචාරක නිවාසය සඳහා විශාල ඉල්ලුමක පැවතියද වර්ෂ 02 ක කාලයක් පරිහරණයෙන් තොරව පැවති බැවින් දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතු විශාල ආදායමක් අහිමිවී තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03ට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස්කර නොතිබුණි.

### 4.2 ක්‍රියාකාර සැලැස්ම

අරමුදල සඳහා ක්‍රියාකාර සැලැස්මක් සකස්කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ එක් අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර තිබුණද අභ්‍යන්තර විගණන වැඩ සටහන් හා විගණන වාර්තා විගණනට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණත් 2012 අගෝස්තු 21 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කළ කාර්ය මණ්ඩලය තුළ විගණන සහායක කර්ය මණ්ඩලයක් අනුමත කරවා ගැනිමක් හෝ අරමුදලේ විෂය පථයට අනුකූලවන පරිදි ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අදාල ඒකකයට අනුයුක්ත කිරීමක් කර නොතිබුණි.

## 4.4 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය තුළ අරමුදලෙන් රු.164,174,438 ක් වූ ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණද 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.5 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හග්ගල දැඩි ස්වභාව රක්ෂිත භූමියේ නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශ තුළ අනවසර අල්ලා ගැනීම් 116 ක් ද, බදුල්ල දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශ තුළ අනවසර අල්ලාගැනීම් 103 ක් ද වාර්තා වී තිබූ අතර, පරිසර සංවේදී ප්‍රදේශයන් වන මෙම රක්ෂිත රැකගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණ.

(ආ) සීමාසහිත පාරිසරික පදනම මගින් අභියාචනාධිකරණයේදී ගොනු කරන ලද නඩුවකට අදාලව හග්ගල දැඩි රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන් නවතාලීම, අනවසර පදිංචිකරුවන් අධිකරණයට ඉදිරිපත්කර ඉවත් කිරීම,හග්ගල දැඩි රක්ෂිතයේ මායිම් සලකුණු කිරීම, අනවසර පදිංචිකරුවන් සඳහා විදුලි පහසුකම් ලබා නොදීම, දැඩි රක්ෂිත ප්‍රදේශයේ අනවසර වගාකටයුතු සඳහා තවදුරටත් බලපත්‍ර නිකුත් කිරීම හෝ දීර්ඝ කිරීම හෝ අලුත් කිරීම අත්හිටුවීම යන නියෝග ක්‍රියාත්මක කිරීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාකර නොතිබුණි.

(ඇ) නුවරඑළිය - අඹේවෙල මාර්ගයේ අඹේවෙල සත්ව ගොවිපල ආරම්භයේ සිට කි.මී 2 ක් පමණ ප්‍රමාණයක් හග්ගල දැඩි ස්වභාව රක්ෂිතයෙන්, අඹේවෙල සත්ව ගොවිපල විසින් අනවසරයෙන් භුක්ති විදීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් මේ දක්වා කිසිදු ක්‍රියාමර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) ශ්‍රී දළදා මාලිගාවට "සින්දු" හා "රාජ" ඇත් පැටවුන් දෙදෙනා ලබාදීම නීතියට අනුකූල නොවන බවට අභියාචනාධිකරණයේ නඩුවක් විභාග වෙමින් තිබූ අතර, ඇත් පැටවුන් දෙදෙනා ලියාපදිංචි කර බලපත්‍ර ලබාගැනීම සිදුකර නොතිබුණි.

(ඉ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ (469 වන අධිකාරය ) 3 සහ 4 (3) (අ) වගන්තියෙහි හා 2009 අංක 22 දරන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධනය) පනතේ 6.2 (2) වගන්තිය අනුව ''ජාතික රක්ෂිත භූමියක මායිමෙන් සැතපුම් එකක් ඇතුළත කිසිම තැනැත්තෙකු විසින් සංචාරක හෝටලයක් ඉදිකිරීම හෝ සංචාරක හෝටලයක් විසින් සපයනු ලබන සේවා හෝ පහසුකම් වලට සමාන යම් සේවා හෝ පහසුකම් සැපයීම නොකළයුතුය'' යනුවෙන් සඳහන් වගන්ති වලට පටහැනිව උඩවලව ජාතික උද්‍යානයේ ප්‍රේරක කලාපයට අයත් භූමියක නිවාඩු නිකේතනයකට අනුමැතිය ඉල්ලා පසුව පරිසර හිතකාමී භාවනා මධ්‍යස්ථානය යනුවෙන් නම වෙනස්කර අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් එයට අනුමැතිය දී තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණයවූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගණම්කරණය

(ආ) වන සත්ව උද්‍යාන ආදායම්

(ඇ) දඩ මුදල් එක් රැස් කිරීම හා ප්‍රසාද දීමනා ගෙවීම

(ඈ) සේවක මණ්ඩල කළමනාකරණය

(ඉ) ලිපි ලේඛන පවත්වාගෙනයාම

(ඊ) අභ්‍යන්තර විගණනය